



ඩි.පි.තෙනුලි සදින්සා අලවත්තැන්න

# ලස්සන දියකිඳුරිය

## ඩී.පී.තෙනුලි සදින්සා අලවත්තැන්න

කතෘගේ වෙනත් කෘති

(සදලිගේ චිත්‍රය)

මහ/මහාමායා බාලිකා විද්‍යාලය

4 ශ්‍රේණිය A

2026.05.10

ISBN NO - 978-624-211-385-2

# පිදුම

මෙම පොත් පිංච
නිර්මාණය කිරීමට
අත්වැලක් වූ මහාමායා
බාලිකා විද්‍යාලයේ ගුරු
මෑණිවරුන්ටත්, මා පිය
දෙපලටත්, අක්කාටත්
සෙනෙහසින් පුදමි.

# පෙරවදන

අනාගත ලෝකයට දියණියන් සූදානම් කිරීමේ අරමුණින් අධ්‍යාපනයේ මූලිකත්වය ගන්නා පාසල් ව්‍යාපෘති තුළින් දශකයකට වැඩි කාලයක් ගතවී ඇති අතර, ගණනාවක් වූ දරුවන් දැයට දායාද කිරීමට හැකිවීම පාසලක් ලෙස අප ලබන සාර්ථකත්වයකි.

මෙම ව්‍යාපෘතිය මගින් පාසල් දරුවන්ට නව සමාජීය, සන්නිවේදන, නිර්මාණාත්මක හැකියාවන් වර්ධනය කරමින් විවිධ කුසලතා සංවර්ධනය කිරීම අරමුණ කරගෙන ක්‍රියාත්මක කර ඇත.

එහි ප්‍රතිඵලයක් ලෙස ලියැවී ඇති මෙම කෘතිය මගින් ශ්‍රී ලාංකීය බෞද්ධ සංස්කෘතිය කන්ද උඩරටට අගයක් එක් කළ දළදා වහන්සේ පිළිබඳ උපහාර දැක්වීම මූලික අරමුණ වේ.

මෙම කෘතිය නිර්මාණය කිරීමට දායක වූ සියලු දෙනාටම මාගේ ස්තුතිය පුද කරමි.

විදුහල්පතිනිය,

ශෂිකලා සේනාධීර,

මහාමායා බාලිකා විදුහල,


මහනුවර.



එකමත් එක කාලයක ගමක් තිබුණා. ඒ ගමේ ගෙදරක පුංචි ගැහැණු ළමයෙක් හිටියා. එයාගේ නම මේරි. එයා ජීවත් වුණේ එයාගේ අම්මයි, තාත්තයි, අක්කයි එක්ක. එයාගේ අක්කගෙ නම එමලි.



මේරි ආසම දියකිඳුරියන්ට. මේරි ආසයි එයා දියකිඳුරියක් වෙනවනම්. ඒත් බෑ, මොකද කියනවනම් එයා මනුස්සයෙක් නිසා. ඉතින් මේරි ඒ ගැන දුකින් තමයි සිටියේ.



ටිකෙන් ටික එයා ලොකු වුණා. දැන් එයා ලොකුයි. මේරි ඉස්කෝලේ විද්‍යාගාරයේ ලොකු පරීක්ෂණයක් කර කර සිටියා. එයා ඒ පරීක්ෂණය ගැන තොරතුරු පොත්පත්, පුවත්පත් සහ වෙනත් ක්‍රමවලින් තොරතුරු හෙව්වා. පාසලේ විද්‍යාගාරයේ සටහන් බැලුවා. ගොඩක් දවස් පරීක්ෂා කළා.



එයාගෙ උත්සාහය නිසා එයාගෙ සිහිනය සැබෑ වුණා. එයගේ පරීක්ෂණ වලින් එයාට ඕනි වෙලාවට දියකිඳුරියක් වෙන්නත් නැවත මනුස්සයෙක් වෙන්න පුලුවන් ද්‍රාවණයක් හොයා ගත්තා.



එයා දියකිඳුරියක් වුන නිසා එයාගේ ගමේ තිබුණු විශාල වැවේ සතුටින් කාලය ගත කළා.

අපි උත්සාහවන්ත වෙමු, අලුත් දේවල් සොයාගමු,ලෝකය දිනමු.



# පසුවදන

අධ්‍යාපන අමාත්‍යාංශයේ අනුමැතිය යටතේ දශකයකට වැඩි කාලයක් පුරා පාසල් දරුවන්ගේ දක්ෂතා වර්ධනය කරමින් ක්‍රියාත්මක වූ මෙම ව්‍යාපෘතිය, පාසල් අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනයට උපකාරී වූ වැඩසටහනක් ලෙස අධ්‍යාපනඥයන් විසින් පිළිගෙන ඇත.

නව අධ්‍යාපන ප්‍රවණතා සමඟ ගැළපෙන ලෙස දරුවන්ට කෘති රචනයට යොමු කිරීම මෙම ව්‍යාපෘතියේ විශේෂත්වයකි.

මෙම කෘතිය මගින් දරුවන්ගේ භාෂා, සාහිත්‍ය සහ නිර්මාණාත්මක හැකියාවන් වර්ධනය කිරීමත්, ඉතිහාසය හා සංස්කෘතිය පිළිබඳ දැනුම ව්‍යාප්ත කිරීමත් අරමුණු කර ඇත.

මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ දියණියන්, විදුහල්පතිනිය, ගුරුවරුන්, දෙමාපියන් සහ දායක වූ සියලු දෙනාටම මෙහිදී ස්තුතිය පිරිනමමි.

සෙනෙවිරත්න මහලේකම්

ව්‍යාපෘති නිර්මාතෘ